# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1724/1 - 2011 සැප්තැම්බර් 19 වැනි සඳුදා - 2011.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.—බී. 94/47 III.

**(269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2) *(ආ)* සහ 21(2) *(ආ)* වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6 (2) *(ආ)* සහ 21 (2) *(ආ)* වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් පිළිබඳ අමාත්‍ය විමල් වීරවංශ වන මා විසින්, මේ නියමය මගින් -

*(අ)* ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත් එය “මොරපේ ශ්‍රී කතරගම දේවාල පූජා භූමිය” යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

*(ආ)* මොරපේ ශ්‍රී කතරගම දේවාල පූජා භූමිය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ සම්පූර්ණ ප්‍රදේශය සම්බන්ධයෙන් පරිබාහිර සැළැස්මක් සකස් කළ යුතු බවටත් විධානය කරනු ලැබේ.

විමල් වීරවංශ,
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් පිළිබඳ අමාත්‍ය.

2011 ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින,
කොළඹ,
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

***මොරපේ ශ්‍රී කතරගම දේවාල පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

සර්වේයර් ජනරාල්ගේ 2010 ජූලි මස 28 වැනි දින අංක NU/KTM/2010/75 දරන සැළැස්මේ නිරූපිත මධ්‍යම පළාතේ, නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේපනේ කෝරලේ සුළු කොට්ඨාසයේ, මොරපේ ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 0.6450 ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය :-

*උතුරට* : ජලාශ රක්ෂිතය ;
*නැගෙනහිරට* : මාවෙල ප්‍රධාන මාර්ගය ;
*දකුණට* : රඹුක්පත්තල ඇළ ;
*බස්නාහිරට* : ගම්සහා පාර.

10-12

1A - G 15089— 355 (2011/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*සැ. යු.- අති විශෙෂ ගැසට් අංක 1723/1 කාණ්ඩය අංක 1723/35 න් අවසන් වේ.*